# දේශීය ශාකවල අවිච්ඡින්න පැවැත්ම සඳහා සාම්ප්‍රදායික කෘෂි තාක්ෂණයේ වැදගත්කම

කහටගස්දිගිලියේ ධම්මරතන හිමි

ශාකය වනාහි මිහිතලයේ පැවැත්ම තුලනය සඳහාත් සත්ව ලෝකයේ පැවැත්ම සඳහාත් ස්වභාව ධර්මය මිනිසාට පවරන ලද භාරයකි. මේ හෙයින් මිනිසාට සේම ශාක ප්‍රජාවටද නිරුපද්‍රිතව ජීවත්වීමට අයිතියක් ඇත. එනමුත් නානාවිධ පුද්ගලික අරමුණු ඔස්සේ ක්‍රියාකරන මිනිසා ඇතැම් ශාක පද්ධතිවල නොයිදුල් පැවැත්ම වෙනස් කරමින් සිටී. විශේෂයෙන් සමාජයේ උගත් යැයි පිළිගත් සමාජ කුලක විද්‍යාගාරවල සිට වෙළඳ අරමුණු ඔස්සේ මෙසේ ශාකවල ස්වභාවික සංයුතිය වෙනස් කරමින් සිටිති. එක් කුලකයක් තම රසායනික නිෂ්පාදනවලට පමණක් ප්‍රතිචාර දක්වන ශාක හා බීජ හඳුන්වා දෙයි. ''වී ගස'' මේ සඳහා පෙන්වා දිය හැකි හොඳම නිදසුනකි. තවත් කුලකයක් විසින් ශාකවල ජානමය වෙනස් කිරීම් කරමින් සිටියි. ශ්‍රී ලංකාවේ පැණි දෙඩම් ගස අද වනවිට සොයා ගැනීමට බැරි තරම්ය. මිදි ගෙඩිය, දෙඩම් ගෙඩිය වැනි වෙනත් ආදේශකයන් මිනිස් පරිභෝජනය සඳහා වෙළඳපොලට පැමිණ ඇත. එනමුත් එම ඵල බුදිනවා මිස එවැනි ශාකයක් වවා ගැනීමේ අයිතිය හෝ හැකියාව සාමාන්‍ය සමාජයට නැත. එනම් මේ වන විටත් ඇතැම් ශාකවල පැවැත්ම තීරණය කරණුයේ සර්වබලධාරී බහුජාතික සමාගම්ය.

මේ ආකාරයට ස්වභාවය හා සංයුතිය වෙනස් කර රසායනික සංයුතීන්ගෙන් පෝෂණය කර අපගේ පරිභෝජනයට එවන භෝග ඵල අනුභවයෙන් අපගේ මිනිස් ශරීරයට කෙරෙන අහිතකර බලපෑම කෙතරම් දැයි නිශ්චිතව ගණනය කර නැත. සහල් නිෂ්පාදනය කරන ප්‍රදේශවලට ආවේණික වකුගඩු ආබාධය මෙවැනි ක්‍රියාකාරකම්වල අයහපත් ප්‍රතිඵලයක් වග නිරීක්ෂණය කළ හැකිය.

මෙවන් වටපිටාවක් තුළ සම්ප්‍රදායික කෘෂි තාක්ෂණය නැවත බලාත්මක කිරීම කාලීන අවශ්‍යතාවයකි. එමගින් ශාකයේ පැවැත්මට හානි නොකර එම ශාකයෙන් අවශ්‍ය ඖෂධ හෝ ආහාරමය සරු අස්වැන්නක් ලබා ගැනීමට අවැසි විධික්‍රම හඳුනාගත යුතුය. එසේම ශාක වඳවීයාම වැලැක්වීමට අවැසි ප්‍රතිකර්ම යෙදිය යුතුය.

සම්ප්‍රදායික කෘෂි තාක්ෂණය නැවත 'ප්‍රතිජීවන' කළ යුතුය. ඒ සඳහා තැන තැන විසිරී පැතිරී ඇති දැනුම නැවත නැවත



රැස්කළ යුතුය. විශේෂයෙන් දීපව්‍යාප්තව මේවන විටත් ආරක්ෂා වී ඇති පුස්කොළ පොත්වල අන්තර්ගත තොරතුරු ඉතා වැදගත්ය. තවද අනෙකුත් ඓතිහාසික මූලාශ්‍රවල අන්තර්ගත තොරතුරු ග්‍රාමීය ගොවි ජනතාව සතු දැනුමද උපයෝගී කර ගත හැකිය. එමෙන් ම ප්‍රායෝගික ක්‍රියාකාරකම් ඔස්සේ ද යම් සීමාවක සිට එහි සාපලාතාව අපට මැන බැලිය හැකිය.

මෙතෙක් සොයාගත් තොරතුරුවලට අනුව පැරණි කෘෂි තාක්ෂණවේදයේ සංවර්ධනය සඳහා විෂයයන් කිහිපයක දැනුම සහය කරගෙන තිබේ. කෘෂි තන්ත්‍රය, ශාක විද්‍යාව, වෘක්ෂායුර්වේදය, ජ්‍යොතිෂය වැනි විෂයයන් ඒ අතර ප්‍රධාන වෙති.

ජලය ශාකවල ප්‍රධානතම ජීවය පවත්වාගෙන යාමට ඉවහල්වන සාධකය ලෙස සලකා ශාක රෝපණය කිරීමට සුදුසු භූමිය[1] ජාංගල (උස්වියලි බිම)[2] සාධාරණ (මධ්‍යස්ථ බිම)[3] ආනූප (තෙත අධික බිම) තුන් ආකාරයකට ව්‍යූහගත කර ඇත.

ගේ උයන්, මල් උයන්, පළතුරු උයන් පිහිටුවීමට සුදුසු දිශාව පිළිබඳව ද සැලකිලිමත් වී ඇත. නිදසුනක් ලෙස ගේ උයනක් සකස් විය යුත්තේ ගෘහයට උතුරු බටහිර සහ නැගෙනහිර දිශාවලටය. නිරිතදිග හා ගිණිකොන ඒ සඳහා නුසුදුසු වග දක්වා තිබේ.

වර්ගයා බෝ කිරීම නැතිනම් පැළකිරීමේ දී සියලුම වෘක්ෂලතා ජාතීහු බීජ රෝප්‍ය, කාණ්ඩරෝප්‍ය, කන්දරෝප්‍ය වශයෙන් තුන් කොටසකට බෙදා දක්වා ඇත. ඇටවලින් උපදිනුයේ බීජ රෝප්‍ය ශාකයි. කඳේ කොටස්වලින් පැළ වනුයේ කාණ්ඩ රෝප්‍ය වර්ගයි. කන්ද රෝප්‍ය යනු අල මුල් වැනි භූගත ස්කන්ධයකින් බෝවන ශාකයන්ය. ඇතැම් ශාකයෝ කිහිප අංශයකින් බෝවන නිසා බහු රෝප්‍ය වෙති.

සංහිතා ග්‍රන්ථවල ශාක වර්ගීකරණය කර ඇත්තේ මෙසේය. බොහෝ මල් සහිතව ඵල හටගෙන ඵල සමයෙන් පසුව විනාශයට යනුයේ ඖෂධීහු ය. වී සහ තිරිඟු මෙනි. මල් නොමැතිව ඵල ඇතිවනුයේ වනස්පතීහුය. නුග දිඹුල් යනාදිය මෙනි. මල් හා ගෙඩිත් හටගන්නා ගස් වෘක්ෂයෝය. පඳුරු සහිත පැළෑටිහු ගච්ඡ නම් වෙති. දෑසමන් යනාදිය මෙනි. මොළොක් වූ කඳන් සහිත විවිධ පැළෑටිහු ගුල්ම නම් වෙති. නොයෙක් වර්ගවලට තණකොළ තෘණ ගණයට අයත් වෙති. බිම දුවන වැල් ප්‍රතාන නම් වෙති. ගසක කඳක එතී හෝ ලණුවක එතී ඉහළට යන ලතාවෝ වල්ලීහු නම් වෙති.

ශස්‍ය වැපිරීමෙහිලා වී, හැල්, තල, ආදිය ප්‍රථම වර්ෂාවෙහි ද මුං ඇට, උඳු ආදිය වර්ෂා සෘතුවේ මැද භාගයේදී ද කොල්ලු, යව ආදී ශස්‍ය වර්ෂා සෘතුවෙහි අවසාන භාගයේදී ද වැපිරීමට නිර්දේශ කර ඇත. එසේම වැපිරීමට ප්‍රථම ශස්‍ය වර්ග නියමිත ඔසු දියර වර්ග වල බහා තබා ප්‍රකෘතියට පත් කළ යුතු බවද දැක්වේ. පැළයක් ගලවා තවත් ස්ථානයකට ගෙන යන විට එහි ආලේප කළ යුතු ඖෂධ සංයෝගයෝ ද වෙති. සුවඳ හොට - වළඟසාල්, මීපැණි ඒ අතර ප්‍රධාන වෙති.

පැළෑටි පෝෂණය සඳහා කාබනික ද්‍රව්‍ය සේම මිනිස් ශරීරයට හානි නොවන අකාබනික ද්‍රව්‍යය ද යොදා තිබීම විශේෂත්වයකි. විශේෂයෙන් ඒවායෙහි පෝෂක ගුණයද ඖෂධ සංයෝගද ඇත. ජීවය හා උද්භිද යනුවෙන් කොටස් දෙකකට බෙදා උද්භිදයෝ ස්ථාවර ජීවිහු වශයෙන් සලකා තිබෙති. දේශීය ආයුර්වේද සිද්ධාන්තවල එන වා, පිත්, සෙම් යන ත්‍රිධාතු න්‍යාය ශාකවලට පොදු වග පිළිගෙන ඇති බැවින් වෘක්ෂවලට වැළැදෙන රෝග වාතජ, පිත්තජ, කඵජ, ආගන්තුක හේතුජ යනුවෙන් සතර වැදෑරුම් වග පිළිගෙන ඇත. මෙසේ රෝගී වූ වෘක්ෂයනට පිළියම්, තුන් වැදෑරුම් වේ. ශල්‍ය චිකිත්සා, ඖෂධ චිකිත්සා, සහ භූත චිකිත්සා යනුවෙනි. රෝග අතු ඉති ඉවත් කිරීම, කැඩුණු අතු බැඳීම, පෑස්සීම, දිලීර ඉවත් කිරීම ආදිය ශල්‍ය චිකිත්සා යි. කෘමි වැළකුම් ආදී බෙහෙත් ද්‍රව්‍ය යෙදීම ඖෂධ චිකිත්සායි. බීජ රෝපණය සඳහාම වෙන්වුණු ''එළදවලිය'' වැනි ජ්‍යොතිෂය ග්‍රන්ථවල එන සිද්ධාන්ත හවුල්කරගෙන ඇත. විශේෂයෙන් නැකත් යෝග බීජ රෝපණයේදී භාවිතකර තිබේ.

මෙම සියළු ක්‍රියාකාරකම්වලදී ගසටත් එහි ඵල විඳින සත්වයාටත් අහිතකර යමක් සිදුනොවීම මෙම පැරණි කෘෂිතාක්ෂණවේදයේ ඇති විශේෂත්වය යි. කරුණු මේ හෙයින් මේ පිළිබඳ ආකල්පමය පරිවර්තනයක් ද එසේම ජීවහිතවාදී එළඹුමකටද කාලය පැමිණ ඇත.